# ත්‍රිපිටක අධ්‍යයනය පිළිබඳ (කෙටිකාලීන) සහතිකපත්‍ර පාඨමාලාව

## පාඨමාලාවේ විෂය ක්ෂේත්‍රය හා එහි අන්තර්ගතය

ත්‍රිපිටක මූලාශ්‍රය අධ්‍යයනය පුළුල් පරාසයක් ආවරණය කෙරෙන විෂය ක්ෂේත්‍රයකි. එබැවින් යෝජිත පාඨමාලාව ආරම්භක පියවරේ දී "**ත්‍රිපිටක මූලාශ්‍රය අධ්‍යයනය 1**" ලෙස නම් කොට පාඨමාලා අන්තර්ගතය ත්‍රිපිටකයෙන් තෝරාගත් කියවීම්වලට සීමා කරනු ලැබේ. එම සීමා කිරීමට අනුව, මෙම පාඨමාලාවේ අන්තර්ගතයට පහත සඳහන් මොඩියුල ඇතුළත් වේ.

1. **මොඩියුලයඃ** පාලි ත්‍රිපිටකයේ ප්‍රභවය හා වර්ධනය

2. **මොඩියුලයඃ** සිඟාලොවාද සූත්‍රය (දීඝනිකාය)

3. **මොඩියුලයඃ** කූටදන්ත සූත්‍රය (දීඝනිකාය)

4. **මොඩියුලයඃ** මහාසතිපට්ඨාන සූත්‍රය (දීඝනිකාය)

5. **මොඩියුලයඃ** අරියපරියේසන සූත්‍රය (මජ්ඣිමනිකාය)

6. **මොඩියුලයඃ** මධුපිණ්ඩික සූත්‍රය (මජ්ඣිමනිකාය)

7. **මොඩියුලයඃ** රට්ඨපාල සූත්‍රය (මජ්ඣිමනිකාය)

8. **මොඩියුලයඃ** සක්කසංයුත්තයේ දුතියවග්ගය (සංයුත්තනිකාය)

9. **මොඩියුලයඃ** කලහවිවාද සූත්‍රය (සුත්තනිපාත)

10. **මොඩියුලයඃ** මඞ්ගල සූත්‍රය (සුත්තනිපාත)

11. **මොඩියුලයඃ** පරාභව සූත්‍රය (සුත්තනිපාත)

12. **මොඩියුලයඃ** කාළුදායි ථේරගාථා (ථේරගාථාපාළි)

13. **මොඩියුලයඃ** චිත්තවග්ග (ධම්මපදපාළි)

14. **මොඩියුලයඃ** උරුවෙලපාටිහාරියකථා (මහාවග්ගපාළි)

15. **මොඩියුලයඃ** පුග්ගලපඤ්ඤත්තිප්පකරණය (ආරම්භයේ සිට ද්වික නිද්දේසය අවසානය දක්වා)

### ඇගයීම

පාඨමාලාව අවසානයෙහි වාචික පරීක්ෂණයක් පැවත්වේ. වාචික පරීක්ෂණයට ඉදිරිපත්වීම සඳහා 80%ක දේශන සහභාගීත්වයක් තිබිය යුතු අතර එම පරීක්ෂණය සාර්ථකව නිමකරන විද්‍යාර්ථීන්ට ආයතනය මඟින් අදාළ මූලාශ්‍රය අධ්‍යයනයෙහි යෙදුණු බව සහතික කෙරෙන සහතික පත්‍රයක් ප්‍රදානය කරනු ලැබේ.

### ඉගැනුම් ඵල

පාලි මූලාශ්‍රය අධ්‍යයනයෙහි වැදගත්කම හඳුනා ගැනීම මගින් පාලි භාෂා අධ්‍යනය කෙරෙහි අවධානය යොමුකිරීම.

### ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම්

පාලි භාෂාව පිළිබඳ පූර්ව දැනුමක් මෙම පාඨමාලාවට ලියාපදිංචිවීම සඳහා අවශ්‍ය නොවන අතර ලියාපදිංචි වීම අපේක්ෂා කරන විද්‍යාර්ථීන් පහත දැක්වෙන සුදුසුකම්වලින් එකක් හෝ සපුරා තිබිය යුතු ය.

පිළිගත් විශ්වවිද්‍යාලයකින් කවර හෝ උපාධියක් ලබා තිබීම

හෝ

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපාකාර සමාගමේ අවසාන පරීක්ෂණයෙන් සමත්වීම

හෝ

ආයතනයේ පීඨ සභාව විසින් පිළිගනු ලබන වෙනත් කවර හෝ සුදුසුකමක්

### පාඨමාලා කාලය

මෙම පාඨමාලාව කාල්පනික ඉගැනුම් පැය (notional learning hours) 390කින් සමන්විත වේ. එම පැය 390වෙන් පැය 90ක් විද්‍යාර්ථීන් හා ඍජු ව සම්බන්ධ වීමට වෙන් කෙරෙන අතර පැය 300ක් ස්වයං අධ්‍යයනය, වාචික පරීක්ෂණයට සූදානම් වීම හා ඇගැයීම සඳහා වෙන් කරනු ලැබේ.

### දේශන පැවැත්වෙන ක්‍රමය

ආයතනික පරිශ්‍රයේදී මෙන් ම මාර්ගගත ක්‍රමයට අනුව දේශන පැවැත් වේ.

## පාඨමාලා පැවැත්වීම

ආයතනය මගින් පවත්වනු ලබන කෙටිකාලීන පාඨමාලාවක් වන මෙම පාඨමාලාව යම් අධ්‍යයනය වර්ෂයක දී පැවැත්වීම සඳහා ප්‍රමාණවත් ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාවක් ආයතනය වෙත ලැබිය යුතුය. ප්‍රමාණවත් ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාවක් නොලැබෙන අවස්ථාවක දී පාඨමාලාව නොපැවැත්වීමේ බලය ආයතනය සතු වේ.

## පාඨමාලා ගාස්තුව

රුපියල් 15000කි.

## පුස්තකාල විමර්ශන ගාස්තු

මෙම පාඨමාලාව සඳහා පමණක් සහභාගි වන ශිෂ්‍යයන් සඳහා පුස්තකාල විමර්ශන ගාස්තු වෙනුවෙන් රුපියල් 1000 මුදලක් අයකෙරේ.